# දැන්වීමයි

## සුභසාධන වෛද්‍ය ක්‍රමය - 2018

## අධ්‍යයන, පරිපාලන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සියලුම ස්ථිර සාමාජික සාමාජිකාවන් වෙත.

කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන, පරිපාලන හා අනධ්‍යයන කාර්‍ය මණ්ඩලයේ ස්ථිර සාමාජික සාමාජිකාවන් සඳහා දැනට ක්‍රියාත්මක වන සුභ සාධන වෛද්‍ය ක්‍රමය 2018.03.01 දින සිට 2019.02.28 දින දක්වා පහත සඳහන් යෝජනා ක්‍රම ත්‍රිත්වය යටතේ තවත් වසරක කාලයකින් දීර්ඝ කර ඇති බව සතුටින් දන්වමි.

| | |
|---|---|
| I යෝජනා ක්‍රමය | සාමාජිකයන් විසින් රු.1,800/- ක මුදලක් මෙම වර්ෂය සඳහා ගෙවිය යුතුය.(2018.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රු. 150/- බැගින් වූ මාසික වාරිකයකින් එම මුදල වැටුපෙන් අඩු කරනු ලැබේ.) |
| II යෝජනා ක්‍රමය | සාමාජිකයන් විසින් රු. 4,800/- ක මුදලක් මෙම වර්ෂය සඳහා ගෙවිය යුතුය.(2018.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රු. 400/-බැගින් වූ මාසික වාරිකයකින් එම මුදල වැටුපෙන් අඩු කරනු ලැබේ.) |
| III යෝජනා ක්‍රමය | සාමාජිකයන් විසින් රු. 7,800/- ක මුදලක් මෙම වර්ෂය සඳහා ගෙවිය යුතුය.(2018.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රු.650/- බැගින් වූ මාසික වාරිකයකින් එම මුදල වැටුපෙන් අඩු කරනු ලැබේ.) |

- සුභ සාධන වෛද්‍ය ක්‍රමයට ලියාපදිංචි වී නොමැති සාමාජික මහත්ම මහත්මීන් සහ දැනට ලියාපදිංචි වී සිටින යෝජනා ක්‍රමය වෙනස් කිරීමට බලාපොරොත්තු වන සියලුම සාමාජික මහත්ම මහත්මීන් නිසි පරිදි පුරවන ලද අයදුම්පත් අධ්‍යයන ආයතන අංශයේ / අනධ්‍යයන ආයතන අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී වෙතින් සහතික කර 2018.02.20 හෝ එදිනට පෙර ශිෂ්‍ය හා සේවක කටයුතු අංශයේ වැඩ බලන නියෝජ්‍ය ලේඛකාධිකාරි වෙත ඉදිරිපත් කළ යුතුය.

- 2017 සුභසාධන වෛද්‍ය යෝජනා ක්‍රමය සඳහා ලියාපදිංචි වී ඇති සාමාජික මහත්ම මහත්මීන් ලියාපදිංචි වී සිටින යෝජනා ක්‍රමය වෙනස් කිරීමට අදහස් නොකරන්නේ නම් නැවත 2018 වසර සඳහා ලියාපදිංචි වීම අවශ්‍ය නොවේ. 2018 වර්ෂයේ සිට ඔවුන්ගේ මාසික වාරික මුදල් ඉහත පරිදි සංශෝධනය වේ.

- සුභ සාධන වෛද්‍ය ක්‍රමයට අදාල තොරතුරු හා අයදුම්පත් ඔබගේ අංශයේ/ අධ්‍යයන අංශයේ/ ඒකකයේ අංශාධිපති වෙතින් හෝ පීඨයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී වෙතින් හෝ විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් හෝ ලබා ගත හැක.

ලේඛකාධිකාරි
කොළඹ විශ්වවිද්‍යාලය
2018 ජනවාරි මස 24 වැනිදා